# කටුවරගාලවැව ගම්මානය ආශ්‍රිත හෙළ ගොවිතැන හා බැඳුණු කෙම් ක්‍රම පිළිබඳ අධ්‍යයනයක්

**ජයසේන එස්.ඩබ්ලිව්.ඒ.ආර්,[1] චන්ද්‍රපාල සී.ඩී.ඩී.[2]**

කෙම් ක්‍රම යනු චිකිත්සක අභිචාරයක්, වාචික සන්නිවේදනයකින් තොර ව රහසිගත ව කරන ලද එක්තරා ගුප්ත පිළිවෙතකි. මේවා කෙනෙකුගෙන් තවත් කෙනෙකුට පවරනු ලබන්නේ එහි ප්‍රත්‍යක්ෂභාවය වටහා ගැනීමෙන් අනතුරුව ය. විශේෂයෙන් ම ගොවිතැන විවිධ උවදුරුවලින් ආරක්ෂා කරගැනීම සඳහා සහ අස්වැන්න වැඩි කරගැනීම සඳහා මෙම කෙම් ක්‍රම භාවිතා කර ඇත. ඖෂධ භාවිත ක්‍රම, යාන්ත්‍රික ක්‍රම, ජෛව විද්‍යාත්මක ක්‍රම ආදී ලෙස මෙම කෙම් ක්‍රම වර්ගීකරණය කළ හැකි ය. එම කෙම්ක්‍රම පිළිබඳව සිදුකරන ලද මෙම අධ්‍යයනයේ අරමුණ වුයේ හෙළ කෙම් ක්‍රම ගොවිතැනට යොදා ගැනීම කෙතරම් තාත්වික ද? යන්න සොයා බැලීම ය. මෙම අධ්‍යයනයේ දී ක්ෂේත්‍ර හා ක්ෂේත්‍ර නොවන ගවේෂණ යොදාගත් අතර පුස්තකාල භාවිතය, කෙම්ක්‍රම පිළිබඳ ජනතාවගේ විශ්වාසය, අත්දැකීම් කෙබඳු ද යන්න ගවේෂණයට කටුවරගාලවැව ගම්මානයේ ජනතාව සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සිදුකරන ලදී. ස්වභාවික පළිබෝධනාශක සමඟ කෙම් ක්‍රම යොදාගැනීමෙන් සමාජ සාරධර්ම සුරැකීම හා ජෛව විවිධත්වය හා ස්වභාවික සම්පත් කළමනාකරණය තුළින් ශිෂ්ට සම්පන්න සමාජයක් මතු පරපුරට දායාද කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. කෙම යන්නට විවිධ වූ අර්ථ ඇත. සාමාන්‍ය ව්‍යවහාරයට අනුව කෙම් ක්‍රම භාවිතා කරනුයේ දෛනික ජීවිතයේ විවිධ කාර්යයන්ට මෙන් ම කෘෂිකාර්මික කටයුතුවල දී පැන නඟින උපද්‍රවවලින් අස්වැසිල්ලක් ලබාගැනීමත් පිණිස යි. කෙසේ වුව ද මෙම අධ්‍යයනය මඟින් කටුවරගාලවැව ගම්මානයේ භාවිත කෙම් ක්‍රම වශයෙන් පණු මර්දනයට පෙරමෝන් භාවිතය, අභිමානා පිදීම ආදියත් කෘමි රෝග පාලනයට කොහොඹ තෙල් පන්දම් දැල්වීම, පොල් කෝම්බ සිටුවීම, මැසි මර්දනයට බට ලී වැනීම, අතු සාත්තුව, මීයන් පාලනය කිරීමට අන්නාසි ගොබ ගැසීම, ගොළුබෙල්ලන් මර්ධනයට තැඹිලි මැතිරීම, පැඟිරි දරවලින් ගොළුබෙල්ලකු සහිත දොඩමක් පිළිස්සීම ආදියත් ඇස් වහා කටවහා දෝෂ දුරු කරගැනීම සඳහා පඹයෙක් සිටුවීම, විසිතුරු මල් වර්ග සිටුවීම යනාදී වූ ක්‍රම හඳුනාගැනීමට හැකියාව ලැබුණ අතර, යල කන්නයේ දී කටුවරගාලවැව ගම්මානයේ ජනතාව එම කෙම් ක්‍රම යොදාගෙන ගොවිතැන් කිරීමෙන් සාර්ථක අස්වැන්නක් ලබාගත් බව මෙම අධ්‍යයනයෙන් පැහැදිලි විය. සමස්තයක් වශයෙන් ගත්කළ මෙම අධ්‍යයනයෙන් හඳුනාගත හැකි වූ නිගමනයන් වශයෙන් වර්තමානයේ මෙම ප්‍රදේශයේ ජීවත් වන වැඩිහිටි පරම්පරාව මෙම දේශීය ඥානය රැකගැනීමට මහත් වෙහෙසක් ගන්නා නමුදු තරුණ පරපුර එම ක්‍රමයන් සම්පූර්ණයෙන් ම බැහැර කිරීමක් සිදුකර ඇති බවකි. එබැවින් කෘමිනාශක භාවිතය නිසාවෙන් මේ වන විට වකුගඩු රෝගීන් විශාල පිරිසක් හමුවන අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ මෙවැනි දේශීය ඥානයන් සමාජගත කිරීම අපගේ යුතුකමකි.

**මුඛ්‍ය පද** : ගොවිතැන, කටුවරගාලවැව, කෙම් ක්‍රම, මර්ධනය, පළිබෝධ

[1]භාෂා අධ්‍යයනාංශය, රජරට විශ්වවිද්‍යාලය. ruwanmalianuradha@gmail.com